*සැ. යු.* - 2024.09.27 දින පළ කරන ලද අංක 2404 *ගැසට් පත්‍රයේ* II, III සහ IV අ කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2405 - 2024 ඔක්තෝබර් මස 04 වැනි සිකුරාදා - 2024.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 374 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 375 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ඔක්තෝබර් මස 25 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ඔක්තෝබර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් දොඩම්පහළ ලොකු යද්දෙහිගේ කාලිංග ප්‍රියවංශ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997.11.17 දින ප්‍රදානය කර ඇති හම්/12/ප්‍ර/45505 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තිස්සමහාරාම, විජයපුර පදිංචි එදිරිසූරිය පටබැඳිගේ ආරියසේන වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/233/3875/97 යටතේ 1997.11.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත් වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.25** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### *උපලේඛනය*

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුවේ, විජයපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, විජයපුර නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.226 ක් විශාලත්වය ඇත්තා වූ ද , පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩමඃ

| | |
|---|---|
| *උතුරට* | : වීරවිල ප්‍රධාන ඇළ රක්ෂිතය ද, |
| *නැගෙනහිරට* | : ආයුර්වේද මධ්‍යස්ථානය පිහිටි ඉඩම ද, |
| *දකුණට* | : ඩබ්ලිව්. එච්. විමලසේන සහ පී. බී. දාවිත් සිංඤෝ පදිංචි ඉඩම ද, |
| *බස්නාහිරට* | : පී. බී. දාවිත් සිංඤෝ පදිංචි ඉඩම ද, වේ. |

ඩී. එල්. කේ. ප්‍රියවංශ,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
තිස්සමහාරාම.

2020 දෙසැම්බර් මස 28 වැනි දින.

10-07/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඉසංක ලක්මාල් වික්‍රමනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2001.01.30 දින ප්‍රදානය කර ඇති අංක හම්/11/ප්‍ර 56097 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 824, කුඩා ගම්මාන 07, දකුණු ඉවුර, ලුණුගම්වෙහෙර පදිංචි ධර්මදාස සේනානායක පතිරණ වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/307/2736/2001 යටතේ 2001.10.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට පත් වීමට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.10.25** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### *උපලේඛනය*

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුවේ, සිංහපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දකුණු ඉවුර, කුඩා ගම්මාන 07 නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති අංක 830011 දරන රේඛා සටහනේ අංක 260 (නිවාස) දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර/0.2326 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ඃ

| | |
|---|---|
| *උතුරට* | : 261 හා 256 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : 257 සහ 258 කැබැල්ල, |
| *දකුණට* | : 125 හා 250 කැබැල්ල, |
| *බස්නාහිරට* | : 250 කැබැල්ල. |

අයි. එල්. වික්‍රමනායක,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
ලුණුගම්වෙහෙර.

2023 නොවැම්බර් මස 21 වැනි දින.

10-07/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් නම්මිනිගේ දිස්නා ප්‍රියදර්ශනී රණසිංහ වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.08.10 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/2/ප්‍ර/20333 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 271, නෝනගම ලිපිනයෙහි පදිංචි එදිරිවීර පටබැඳිගේ සොපිනෝනා යන අය වෙත ප්‍රදානය කොට ඇති පහත උපලේඛනයෙ හි දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැතිවීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද, ඔහු අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බව මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය **2024.10.25** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**එකී උපලේඛනය**

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ/නෝනගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ලුණම නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 08 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අගපි 467 දරන පිඹුරෙහි අංක 197 දරන බිම්කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 01 පර්චස් 07 ක් ඇතැයි ගණන් බලා තිබෙන තාරගමලන්ද යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : ලොට් 228, |
| *නැගෙනහිරට* | : ලොට් 196 හා 198, |
| *දකුණට* | : ලොට් 228, |
| *බස්නාහිරට* | : ලොට් 228. |

එන්. ඩී. පී. රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

2023 අගෝස්තු මස 31 වැනි දින.

10-07/3

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/72074.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NWP/PLC/L9/NK/LTL/35.

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 316, හල්මිල්ලෑව ග්‍රාම නිලධාරී වසමේ, හල්මිල්ලෑව ගමේ අ. ග. පි. 2966 හි කැබලි අංක 498 න් කොටසක් සඳහා ජනපද නිලධාරී විසින් අඳින ලද දළ අනුරේඛනයේ කැබලි අංක A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01 ක් විශාල වූ රජයේ ඉඩම් කොටස සීමාසහිත නිකවැරටිය විවිධ සේවා සමුපකාර සමිතිය විසින් බද්දු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | |
|---|---|
| *උතුරට* | : ඩී. එම්. කරුණාරත්නගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : කේ. එම්. රංහාමිගේ ඉඩම, |
| *දකුණට* | : ඇලවක සිට බලල්ල දක්වා මාර්ගයේ රක්ෂිතය, |
| *බටහිරට* | : රජය සතු ඉඩම |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2023.12.11 සිට 2053.12.10 දක්වා)

(ආ) *වාර්ෂික බදු මුදල* .- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම 2023 වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ,

*(ඈ)* මෙම ඉඩම හල්මිල්ලෑව ප්‍රාදේශිකය පවත්වාගෙන යාම මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය,

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2023.12.11 දින සිට වසර 05 ක් ගතවන තුරු මෙම ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහාවන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 10

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/68631.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NP/28/04/02/SLO/43/1666.

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

වව්නියාව දිස්ත්‍රික්කයේ, වෙංගලචෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුදලියාර්කුලම් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කප්පාච්චි ගමේ දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 10 ක රජයේ ඉඩම ආගමික කටයුතු සඳහා සන්දිරසේහර්ච්චරම් (වෙලවාලෙයි සිවන් දේවාලය) නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර, |
| *නැගෙනහිරට* | : | මුදලියාර්කුලම රජයේ ඉඩම, |
| *දකුණට* | : | මුදලියන්කුලම, |
| *බටහිරට* | : | වච්චාලෙයි වැව |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2022.06.30 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, ගරු ඇමතිතුමා බදු අනුමත කළ වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ආගමික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2022.06.30 දින සිට වසර පහක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 02 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 11

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/32818.
*සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය* : KN/LTL/984 B

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හාතියගම ග්‍රාම නිලධාරි වසමේ, කන්තලේ ගමේ ජනපද නිලධාරි දළ අනුරේඛනයෙ හි කැබලි බී ප්‍රමාණයෙන් පර්චස් 33 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා ලෙව් දෙණියේ ගෙදර විජේසේකර මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙ හි මායිම් මෙහි පහත සඳහන් වේ:

කැබලි අංක බී හි මායිම් -

| | | |
|---|---|---|
| *උතුරට* | : | එල්. ජී. රත්නසේකරගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | ලයිට් පාර සහ කැබලි අංක ඒ, |
| *දකුණට* | : | යූ. වික්‍රමසිංහගේ ඉඩම, |
| *බටහිරට* | : | ඒ. ජී. පුංචි බංඩාගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (1995.06.15 දින සිට 2025.06.14 දක්වා)

*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

*දඩ මුදල* : ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 1995.06.15 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 12

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/74483.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : UPLC/L/26/KG/L/223

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මොණරාගල දිස්ත්‍රික්කයේ, කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 146 ඩී කරවිල ග්‍රාම නිලධාරි වසමේ, මයිලගම ගමෙහි පිහිටි බලයලත් මානක එල්. කේ. ගුණසේකර මහතා විසින් මැන සකස් කරන ලද අංක 7072 දරන පිඹුර මගින් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 01 පර්චස් 1.42 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා මල්ලව ආරච්චිගේ අසංක සුධීර පෙරේරා මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙ හි මායිම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මැණික් ගඟ රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | මාර්ගය, |
| *දකුණට* | : | සිරිසේන විජේසිංහ සම්පත් උපාලි ජයවීර හිමිකම් කියන ඉඩම, |
| *බටහිරට* | : | ස. ණ. ස. සංචාරක බංගලාව |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2023.04.27 - 2053.04.26 දක්වා)

*වාර්ෂික බදු මුදල* .- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපල වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (5,000,000) ට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2023.04.27 දින සිට වසර 05 ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 13

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/32823.
*සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය* : KN/ALC/M2/LTL/840 II.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කන්තලේ නගරය 227 ග්‍රාම නිලධාරී වසමේ, කන්තලේ ගමේ ජනපද නිලධාරී දළ අනුරේඛනයෙහි කැබලි අංක 6444/බී සහ 6445/සී ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.078 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා බෙන්තර ගුරුගේ චන්නක සම්පත් ගුරුගේ මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

කැබලි අංක 6444/බී හි මායිම් -

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 6445, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 6444/ඒ, |
| *දකුණට* | : | කැබලි අංක 6445/සී, |
| *බටහිරට* | : | කැබලි අංක 6446 |

කැබලි අංක 6443/සී හි මායිම් -

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 6444/බී සහ 6444/ඒ, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 6428, |
| *දකුණට* | : | කැබලි අංක 6447, |
| *බටහිරට* | : | කැබලි අංක 6446 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(*අ*) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (1995.06.15 දින සිට 2025.06.14 දක්වා)

*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

දඩ මුදල : ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි.

(*ආ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුලතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(*ඈ*) ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(*ඉ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(*ඊ*) 1995.06.15 දින සිට වසර 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(*උ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකළ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2024 සැප්තැම්බර් මස 07 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 14

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/76120.
*මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : CPC/LC/LD/4/1/27/334.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අවුඩංගාව ඊ 453 ග්‍රාම නිලධාරී වසමේ, අවුඩංගාව ගමේ කැඩැස්තර සිතියම් අංක 310054 කලාප 05 න් 03 වැනි කලාපය කැබලි අංක 128 න් දැක්වෙන, ප්‍රමාණයෙන් රූඩ් 02 පර්. 20.5 ක් වූ රජයේ ඉඩම් කොටස වර්ණකුලසූරිය ජෝර්ජ් නැපොලියන් ලන්සා මයා වෙත වාණිජ කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැඩැස්තර සිතියම් අංක 310054 හි කලාප 03 හි කැ. අ. 99 (ප්‍රාදේශීය සභා මාර්ගය), |
| *නැගෙනහිරට* | : | කැඩැස්තර සිතියම් අංක 310054 හි කලාප 03 හි කැ. අ. 129 සහ 99, |
| *දකුණට* | : | කැඩැස්තර සිතියම් අංක 310054 හි කලාප 03 හි කැ. අ. 122, |
| *බටහිරට* | : | කැඩැස්තර සිතියම් අංක 310054 හි කලාප 03 හි කැ. අ. 123. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2024.08.07 දින සිට වසර 30 ක් ඉදිරියට)

*(ආ) වාර්ෂික බදු මුදල*.- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තකසේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ මිලියන පහට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වා ගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* 2024.08.07 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිග බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

*(ඒ)* නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පනවන කොන්දේසිවලට මෙම බද්ද යටත් විය යුතුය.

මෙහි පහත සඳහන් දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. ජී. පී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 24 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 29

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/76597.
*ඉඩම් කොමසාරිස්ගේ අංකය* :
එන්සීපී/පීඑල්සී/එල්5/එම්ඩබ්/04/දීර්ඝකාලීන.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 358 ඔයාමඩුව ග්‍රාම නිලධාරි වසමේ, ඔයාමඩුව ගමේ බලයලත් මිනින්දෝරු සී. එස්. ලියනගේ (එම්. එස්. අයි.) විසින් අඳින ලද අංක 2021/27/C දරන අනුරේඛනයේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 02 ක් පමණ වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුත්තක් සඳහා MARS LANKA AGRO PRODUCTS (PVT) LTD නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ:

*උතුරට* : රජයේ ඉඩම,
*නැගෙනහිරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය),
*දකුණට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය),
*බටහිරට* : රජයේ ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2023.05.29 - 2054.05.28)

*වාර්ෂික බදු මුදල* .- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (5,000,000) ට වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුලතදී පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළයුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2024.05.29 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 37

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/74021.
*ප්‍රාදේශීය ලේකම් (නුවරඑළිය) ගේ අංකය* : නුඑ/3/2/1/2/1102.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 535ජී උතුරු හාවාඑළිය ග්‍රාම නිලධාරි වසමේ හාවාඑළිය ගමේ රජයේ මිනින්දෝරු විසින් අඳින ලද අනුරේඛන අංක 2544/99 හි කැබලි අංක 01 මගින් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 10 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල වාණිජ පදනමින් විජේසුන්දර මුදියන්සේලාගේ නාමල් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ:

*උතුරට* : මාර්ග රක්ෂිතය,
*නැගෙනහිරට* : ටී. එම්. බුහාරි පදිංචි ඉඩම,
*දකුණට* : දිසාපති මැදුර ඉඩම,
*බටහිරට* : ඩබ්ලිව්. එම්. කරුණාපාල භුක්ති විඳින ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (ගරු ඇමතිතුමා අනුමත කළ 2024.06.28 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* .- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩු වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපල වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (5,000,000) ට වැඩි වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ.

*(ආ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම් සමරතුංග,<br>
සහකාර ඉඩම් කොමසාරිස්,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,<br>
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",<br>
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 38

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/74061.<br>
*ප්‍රාදේශීය ලේකම් (කොත්මලේ) ගේ අංකය : 3/2/9/2/4/2/2.*

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 460ඊ කළුදැමඩ ග්‍රාම නිලධාරී වසමේ හපුගස්තලාව ගමේ කැඩැස්තර සිතියම් අංක 330308 පිඹුරේ කැබලි අංක 191 මඟින් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 39.2 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල ආගමික කටයුතු සඳහා අල් මස්ජිදුල් මින්හාජ් ජුම්මා පල්ලියේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ:

| | |
|---|---|
| *උතුරට* | : මෙම පිඹුරේ කැබලි අංක 16 හා මාර්ගය, |
| *නැගෙනහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 16 හා 274, |
| *දකුණට* | : මෙම පිඹුරේ කැබලි අංක 192, |
| *බටහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 190 |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (ගරු ඇමතිතුමා අනුමත කළ 2024.06.28 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, ගරු ඇමතිතුමා අනුමත කරන වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* මෙම ඉඩම ආගමික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* සාදා ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඌ)* ගරු ඇමතිතුමා අනුමත කරන දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම් සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 39

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/76183.
*ඉඩම් කොමසාරිස්ගේ අංකය* : LCD/1/2/9/1-14.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 56, ලුණුගම්වෙහෙර නව නගරය ග්‍රාම නිලධාරි වසමේ, ලුණුගම්වෙහෙර නව නගරය ගමේ අ. හු. පි. 03 පිඹුරේ කැබලි අංක 7590 න් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.012 ක් වන රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ජාසිං ආරච්චිගේ පද්මසීලි මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 7585, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 7591, |
| *දකුණට* | : කැබලි අංක 7596, |
| *බටහිරට* | : කැබලි අංක 7589. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30). (2024.08.07 දින සිට වසර 30 ක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහක හෝ (රු. 5,000,000) පහට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදුද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2024.08.07 දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කරගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළ කරන දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. වී. ඒ. ඩී. ඉෂාරා එම් සමරතුංග,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 40

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2024.10.04 | සිකුරාදා | 2024.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.11 | සිකුරාදා | 2024.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.18 | සිකුරාදා | 2024.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.25 | සිකුරාදා | 2024.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2024.11.01 | සිකුරාදා | 2024.10.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.08 | සිකුරාදා | 2024.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.14 | බ්‍රහස්පතින්දා | 2024.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.22 | සිකුරාදා | 2024.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.29 | සිකුරාදා | 2024.11.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2024.12.06 | සිකුරාදා | 2024.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.13 | සිකුරාදා | 2024.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.20 | සිකුරාදා | 2024.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.27 | සිකුරාදා | 2024.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.